# 10. පොසොන් උත්සවය



පොසොන් උත්සවය බෞද්ධයන් වන අපට ඉතා වැදගත් වන සංස්කෘතික වටිනාකමක් ඇති උත්සවයකි.

එනම් අප රටට බුද්ධාගම ලැබුණේ මෙම පොසොන් දිනයේදී බැවිනි. මිහිඳු මා හිමියන් අනුරාධපුරයේ මිහින්තලාවට වැඩම කොට එවකට ලංකාවේ රජකළ දේවානම් පියතිස්ස රජු ප්‍රමුඛ කොට බුද්ධාගම ලබා දීමෙන් පසු අප රට බෞද්ධ රටක් බවට පත්විය.

අදද මෙම උත්සවය සමරන්නේ අති උත්කර්ෂවත් අන්දමිනි. ඇතැම් ප්‍රදේශවල ගායනා, වාදන, නර්තන ඇතුලත් සංස්කෘතික අංගවලින් යුත් පොසොන් පෙරහැර පවත්වයි. මේ මගින් අන්‍යෝන්‍ය සම්බන්ධතා ගොඩ නැගේ. ආගමික නාට්‍යය, භක්ති ගීත, ගායනා මෙම උත්සවයේ දක්නට ලැබෙන තවත් සංස්කෘතික අංගයකි.